**සි/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම - 2018/2019**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සි/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ ("සමාගම") 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේග මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව

හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 74 (ඒ) ඡේදය ප්‍රකාරව ඇප සුරැකුම් ලෙස තබන වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කලයුතු වුවද සමාගම විසින් 2016 වර්ෂයේදී රු.78,000,000ක කාරක ප්‍රාග්ධන ණය ලබාගැනීමේ දී ඇපසුරැකුම් ලෙස තබන ලද කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව පිහිටි ඉඩම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කර ඇප සුරැකුම් ලෙස තබන ලද වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතයේ ප්‍රතිපාදන ප්‍රකාරව ඇප සුරැකුම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී විකුණන ලද රු.1,000,000 ක පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද තේ වියලුම් යන්ත්‍රයෙහි පිරිවැය හා සමුච්චිත ක්ෂය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගිණුම්වලින් ඉවත්කර | මෙම වියලුම් යන්ත්‍රයේ පිරිවැය සොයා ගැනීමට ප්‍රමාණවත් ලිපි ලේඛන නොමැති බැවින් එය ඉවත් කර නොමැති අතර වත්කම් ප්‍රත්‍යාගණනය මෙම වර්ෂයේදී සිදුකර අවසන් බැවින් මෙම වටිනාකම එමගින් නිවැරදි | විකුණන ලද වත්කමෙහි පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත්කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | කරනු ඇත. | |
| (ආ) | තේ ශක්ති අරමුදලට අයත් මැණික්දිවෙල ඉඩමෙහි කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා සමාගම විසින් වැයකරන ලද රු. 59,532,264 ක් ලැබියයුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ගොඩනැගිලි ලෙස දක්වා ඊට අදාළ ක්ෂය ගැලපීම් සිදු කර තිබුණි. | මේ වන විට අදාල කර්මාන්තශාලාව අප සමාගම වෙත ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් එම මුදල සමාගමේ වත්කමක් ලෙස සඳහන් කිරීම නිවැරදි වේ. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව මැණික්දිවෙල කර්මාන්තශාලාව සමාගම වෙත ලබාගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ණයගැති ගිණුම් 05ක ශේෂය | 7,135,440 | 5,812,772 | 1,322,668 | මෙම වෙනස Forbes & Walker ආයතනයේ ගබඩාව වෙත යවන ලද තේ වල හිඟ (Short Delivery) වටිනාකම්වල එකතුවෙන් හා මැණික්දිවෙල කර්මාන්තශාලාව වෙත සපයන ලද දළු සඳහා වැඩිපුර ගෙවන ලද අත්තිකාරම් මුදලින් සමන්විත වන අතර ඒවා නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | ශේෂ සැසඳීම් කර අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) බී.සී.සී. ලංකා සමාගමට ගෙවිය යුතු කුලී | 750,000 | කුලී ගිවිසුම | රු. 750,000 ක මුදල ගෙවිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර ඇතත් බී සී සී ලංකා සමාගම සහ අප සමාගම අතර විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | බදු පදනම මත ගොඩනැගිලි ලබාගැනීමේදී ආදාළ පාර්ශවයන් සමඟ වලංගු ගිවිසුමකට එළඹීමට කටයුතු කල යුතුය. |
| (ආ) පොහොර සමාගම | 728,048 | ශේෂ සනාථ කිරීමේ ලිපි | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ශේෂයන් නිවැරදි කිරීමට කඩිනමින් කටයුතු කල යුතුය. |
| (ඇ) තේ විකුණුම් මධ්‍යස්ථාන යෙන් ලැබිය යුතු ශේෂය | 2,481,141 | විස්තරාත්මක උපලේඛන | දැරංගල සහ හිනිදුම කර්මාන්තශාලා වලින් කළුබෝවිටියාන කර්මාන්තශාලාවේ තේ අලෙවිසැල වෙත එනව ලද පිළිවෙලින් රු.2,119,800 ක හා රු.230,000 ක ප්‍රමාණයක් 2019.03.31 දිනට ගිණුම්ගත කර ඇති අතර මෙම තේ තොග ඇසුරුම් කිරීමෙන් පසු අලෙවි අංශය වෙත එවීමට නියමිත වේ. | ගිණුම්වලට අදාළ උපලේඛන ඉදිරිපත් කල යුතුය. |
| (ඇ) ණයගැති ශේෂය | 14,641,152 | ශේෂ සනාථ කිරීමේ ලිපි | ශේෂ වල තහවුරුව සෘජුවම විගණන අංශය වෙත ලැබීමට අදාල ලිපි එම ආයතන වෙත යවා ඇත. | ශේෂ සනාථන විගණනය වෙත ලැබීමට කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 වර්ෂයේදී BCC ලංකා සමාගමට රු 10,000,000.ක ණය මුදලක් සියයට 22ක පොලි අනුපාතිකයක් මත වාරික 12කින් අයකර ගැනීමේ පදනම මත ලබාදී තිබුණු නමුත් එක් වාරිකයක් හෝ අයකරගැනීමට නොහැකිවී තිබීම මත සමාලෝචිත වර්ෂයේ අවසානයට අයවිය යුතු මුළු මුදල රු.52,910,605 ක් විය. | බී සී සී ලංකා සමාගම සතු අක්කර 06ක ඉඩම් ප්‍රමාණය බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත අත්පත් කර දී ඇති බැවින් එහි වටිනාකම බී සී සී ලංකා සමාගම වෙත ලැබූ වහාම අප ආයතනය වෙත එම මුදල් පියවීමට ඔවුන් ලිඛිතව පොරොන්දු වී ඇත. | ණය මුදල කඩිනමින් අයකර ගැනිමට කටයුතු කල යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | | | |
| (i)9.3.1.(වී) ඡේදය | වැඩ බැලීම් පත් කිරීමක් කලයුත්තේ නිත්‍ය පත්කිරීමක් කරන තෙක් තාවකාලික පදනම මත වුවත් සමාගමේ ප්‍රධාන කාර්යාලයේ සහකාර කළමනාකරු (අලෙවි) තනතුර සඳහා නිත්‍ය පත් කිරීමක් සිදුනොකර 2017 මාර්තු 22 දින සිට නිලධාරියකු වැඩබැලීම සඳහා පත්කර තිබුණි. | වියදම අවම කර ගැනීම සඳහා ආයතනයේ සේවකයකු වැ.බ. පදනමින් සහකාර කළමණාකරු (අලෙවි) තනතුරේ සේවයේ යොදවන ලදී.<br>වර්තමානය වන විට අලෙවි අංශයේ යම් ප්‍රගතියක් වාර්තා කර ඇති බැවින් ස්ථිර වශයෙන් සහකාර කළමණාකරු (අලෙවි) තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇත. | අදාල අනුමැතීන් සහිතව සහකාර කළමනාකරු (අලෙවි) තනතුර සඳහා නිත්‍ය පත්වීමක් ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ii)9.14 ඡේදය | මානව සම්පත් කලමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද, සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මානව සම්පත් කළමණාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීම අදාළ කාර්ය පරිපාටි අත් පොතක් සකස් කිරීමට කටයුතු කරනු ඇත. | කාර්ය පරිපාටි අත්පොතක් සකස් කර ඒ සඳහා අදාල අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) 2015 මැයි 25 දිනැති අංක 01/2015දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |

| | | | |
|---|---|---|---|
| (i) 3.2.1 ඡේදය | රාජකාරී ඉටු කිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවලදී සභාපතිවරයා විසින් අතිරේකව ලබා ගන්නා ඉන්ධන සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් , සමාගමේ සභාපතිවරයා විසින් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා භාවිත කල වටිනාකම රු.243,854 ක් වූ අතිරේක ඉන්ධන සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි | අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016.10.12 දිනැති ලිපිය මගින් මෙම ඉන්ධන සඳහා ගෙවීම් කිරීම අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියෙන් සිදු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ විරුද්ධත්වයක් නොමැති බව දන්වා ඇත. ඒ අනුව 2017.05.25 පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදි මසකට ඉන්ධන ලීටර් 91 ප්‍රමාණයක් ප්‍රතිපූර්ණය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව රාජකාරී කටයුතු සඳහා අමතර ධාවනය වෙනුවෙන් වැය කරන ලද ඉන්ධන වලට වැය කරන ලද මුදල් ප්‍රතිපූර්ණය කර ඇත. | මාසික අනුමත ඉන්ධන සීමාව තුල කටයුතුකිරීමට කටයුතු කළ යුතු අතර අතිරේක ඉන්ධන සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අනුමැතිය ලබාගැනිමට කටයුතු කල යුතුය |
| (ii) 3.2.2 ඡේදය | විධායක අධ්‍යක්ෂකවරු හා අනෙකුත් නිලධාරීන් වෙත අතිරේක ඉන්ධන ප්‍රතිපූරණය කිරීමට ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවද, රු. 157,411 ක් වූ අතිරේක ඉන්ධන සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මෙම ඉන්ධන ප්‍රතිපූර්ණය කිරීම සභාපතිතුමාගේ අනුමැතියෙන් හා කළමණාකාර අධ්‍යක්ෂක අනුමැතියෙන් සිදු කර ඇත. | මාසික අනුමත ඉන්ධන සීමාව තුල කටයුතුකිරීමට කටයුතු කළයුතු අතර අතිරේක ඉන්ධන සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අනුමැතිය ලබාගැනිමට කටයුතු කල යුතුය. |
| (ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. මු.රෙ.387 | චෙක්පත් මගින් ගෙවීම් කිරීමේදී තම බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා විසින් නිරන්තරයෙන් අවධානයෙන් පසුවිය යුතු වුවද ගෙවීම් කරන නිලධාරියා විසින් බැංකු ශේෂය ප්‍රමාණවත් බව තහවුරු කරගැනීමකින් තොරව චෙක්පත් ලිවීම හේතුවෙන් වර්ෂය අවසානයේදී රු. 81,708,981ක අයිරා | 2015 වර්ෂයේදී වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ සහ අමාත්‍යාංශයේ ඍජු මැදිහත්වීම මත තේ ශක්ති ආයතනයට බැංකු අයිරාවක් මත රු. මිලි 50 ක් ලබා දීම හා දින 100 වැඩසටහන යටතේ මැණික්දිවෙල කර්මාන්තශාලා ඉදි කිරීම (රු. මිලි 76) වැනි කරුණු හේතුවෙන් ආයතනයේ මුදල් ශේෂය බැංකු අයිරාවක් මත ඇතිවිමට හේතුවූ අතර හිනිදුම හිල්ස් සහ මැණික්දිවෙල කර්මාන්තශාලාව දිගින් දිගටම පාඩු ලැබීම | චෙක්පත් මගින් ගෙවීම් සිදුකිරීමේදී සමාගමේ මාසිකමුදල් ප්‍රවාහය සැලසුම් සකස් කර ගෙවීම් කිරීමට කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| ශේෂය වෙනුවෙන් අයිරා පොලී ලෙස රු. 12,168,970 ක මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. | හේතුවෙන් එම කර්මාන්තශාලා මගින් ඍණ මුදල් ප්‍රවාහයක් පැවතිම හේතුවෙන් දිගින් දිගටම මුදල් ශේෂය බැංකු අයිරාවක් මත පැවතීම අවම කර ගැනීමට නොහැකි වී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු 50,211,574 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,285,757 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.46,925,817 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම ඉක්මවා විකුණුම් පිරිවැය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)වෙනත් රාජ්‍ය ආයතනයක කළමණාකරුවකු ලෙස නිත්‍ය තනතුරේ පූර්ණ කාලීනව රාජකාරී සිදුකර එම තනතුරට අදාළ වැටුප් හා දීමනා ලබන නිලධාරිනියක මෙම සමාගමේ විධායක අධ්‍යක්ෂක ලෙස පත්කර පූර්ණ කාලීන විධායක අධ්‍යක්ෂකවරයකුට හිමි දීමනා සහ ඉන්ධන දීමනා ලෙස රු. 718,825 ක් සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. | 2018 ජූලි 19 වැනි දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදි 2018 ජූලි 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂකවරයකු පත් කර ඇත. ඒ අනුව චක්‍රලේඛ අංක PED 3/2015 අනුව තනතුරට හිමි දීමනා හා වරප්‍රසාද ලබාදී ඇත. 2019 අප්‍රේල් මස සිට විධායක අධ්‍යක්ෂකතුමියගේ වාචික ඉල්ලීම මත මාසික දීමනාවෙන් 50% ගෙවනු ඇත. | වෙනත් රාජ්‍ය ආයතනයක පූර්ණ කාලීනව සේවය කරනු ලබන නිලධාරිනියක විධායක අධ්‍යක්ෂක තනතුරට පත් කිරීමත්, පූර්ණ වැටුප් ලබාදීමත් නොකල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)විකිණීම සඳහා වෙන්දේසිය වෙත ඉදිරිපත් කිරීමට තැරැව්කාර සමාගමක් වෙත යවන ලද නිමි තේ වටිනාකම මත එම සමාගමෙන් එකතුව රු.93,679,116ක් කෙටිකාලීන ණය ලෙස ලබාගෙන රු.938,922ක් පොලී ලෙස ගෙවා තිබුණ ද, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ආයතනයේ මුදල් ප්‍රවාහ පවත්වාගෙන යාම සඳහා ආයතනයේ සභාපතිතුමාගේ අනුමැතිය මත මෙම මුදල් තැරැව්කරුවන්ගෙන් ලබා ගනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම මාසයකට වරක් පවත්වන බැවින් එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන වියදම් කිරීම ප්‍රායෝගික නොවේ. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ණය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)නිල වාහන සඳහා සුදුසුකම් නොලබන,අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකුට වාහනයක් ලබා දී ඉන්ධන සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.152,760 ක දීමනාවක් ලබා දී තිබුණි. | 2018.01.04 දිනැති සභාපතිතුමාගේ අත්සනින් යුතු ලිපිය මඟින් මෙම අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික වෙත අළුතින් ආරම්භ කරන ලද මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු අධීක්ෂණය කිරීමට හා තේ දළු ලබාගැනීම සම්බන්ධ වැඩසටහන් අධීක්ෂණය කිරීම වැනි රාජකාරී පවරා ඇති අතර මෙම රාජකාරී කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම මෝටර් රථයක සේවය ලබාදී ඇති අතර රාජකාරී කටයුතු සඳහා ධාවන කිරීම වෙනුවෙන් ධාවනය කල දුර අනුව ඉන්ධන ලබාදී ඇත. | චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීමටත් නිල වාහන සඳහා හිමිකම් නොලබන නිලධාරින්ට ලබා දී ඇති දීමනා අයකරගැනීමටත් කළමනාකාරිත්වය කටයුතු කල යුතුය. |
| (ඈ) 2018 දෙසැම්බර් 07 දිනැති අංක පීඊඩී 03/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, 2016 මූල්‍ය වර්ෂය තුළ දී අලාභ තත්ත්වයක් වාර්තා කර ඇති හා එම අලාභදායී බව 2017 මූල්‍ය වර්ෂය තුළ දී අඩු කර ගැනීමට අපොහොසත් වූ සමාගම් වල සේවය කරන සේවකයින් කෙරෙහි සානුකම්පිතව සලකා බලා එක් සේවකයකු සඳහා රු.3,000 බැගින් රු.252,000 මුදලක් පමණක් | සමස්ථ තේ පද්ධතිය කඩා වැටීම මත තේ කර්මාන්තයෙහි ලාභදායී තත්වය අඩු වී ඇත. එනමුදු සේවකයන් දිරිමත් කිරීම කළ යුතු බැවින්ද ඔවුන්ගේ ආර්ථික පසුබිම ඉහල නැංවිය යුතු බැවින්ද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මෙය ගෙවා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රසාද දීමනා නිලධාරීන්ට ගෙවීමට කටයුතු කල යුතුය. |

ප්‍රසාද දීමනා ලෙස ගෙවිය හැකි වුවද එම මුදල ඉක්මවා රු. 559,719 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවේ නිෂ්පාදනය ඉහල නංවා ගැනීමේ අරමුණින් අමු දළු ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී දළු සැපයුම්කරුවන්හට අමුදළු දිරිදීමනා වශයෙන් රු.2,167,569 ක් ගෙවා තිබුණු අතර එම වැඩසටහන අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු පත්කර තිබුණද ඉකුත් වර්ෂයට සාපේකෂව අමු දළු මිලදී ගැනීම කිලෝ ග්‍රෑම් 74,540කින් අඩුවී තිබුණි. ඒ අනුව ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | අමු දළු දිරි දීමනා ලබා දුන්නද ප්‍රමාණවත් තරම් උසස් තත්වයෙන් යුතු සැපයුම්කරුවන් සොයා ගැනීම අපහසු වී ඇත. මෙම හේතුව නිසා 2019/2020 වර්ෂයේ දළු දිරි දීමනා නවතා ඇත. | ඉලක්කගත අරමුණු ඉටු කරගැනීමට හැකි වන අයුරින් කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය |
| (ආ) හිනිදුම තේ කර්මාන්තශාලාවේ අමු දළු ලබා ගැනීම ඉහළ නංවා ගැනීම සඳහා සමාගම විසින් දළුසැපයුම්කරුවන්ට රු.672,028 ක දිරිදීමනා ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අමු දළු ලබා ගැනීම පසුගිය වර්ෂයට සාපේක්ෂව කිලෝ ග්‍රෑම් 349,704කින් පහතවැටී තිබුණ ද, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කළමනාකාරීත්වය විසින් ගෙන නොතිබුණි. | වෙළඳපොලේ නිමි තේ මිල පහත වැටෙන කාලයන්හී දී නිෂ්පාදනය අඩු කිරීම සඳහා මිලදී ගන්නා අමු දළු ප්‍රමාණයද අඩු කරන ලදි. එමගින් ආයතනයේ අලාභය අඩු කර ගන්නා ලදි. තවද උසස් තත්වයෙන් යුතු අමු දළු මිලදී ගැනීමට කළමණාකාරීත්වය තීරණය කළ බැවින් උසස් තත්වයෙන් යුතු අමු දළු මිලදී ගැනීම සඳහා දිරි දීමනා ගෙවන ලදි. | දිරිදීමනා ලබාදීමේදී ඒ තුළින් සමාගමේ අපේක්ෂිත අරමුණු ඉටුවන බවට කළමනාකාරිත්වය වගබලාගත යුතුය. |